8th International Conference of Multidisciplinary Approaches (iCMA), 2021
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# පරිසරය හා තදනුබද්ධ වූ වෘක්ෂ ඇදහිලි විශ්වාස පිළිබඳ අධ්‍යයනය

පීරිස් ඩී.පී.ආර්.

පහතරට නර්තන අධ්‍යයනාංශය, නර්තන හා නාට්‍ය කලා පීඨය,
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
rohanadp1234@gmail.com

**සාරසංක්ෂේපය**

පරිසරය හා මිනිසා අතර පවතිනුයේ අවියෝජනීය බැඳීමකි. ඒ අතර පරිසර සමතුලිතතාවට වෘක්ෂ හා මිනිසා අතර ඇති අන්තර් සම්බන්ධතාව වැදගත් වේ. ලක්දිව පහතරට ශාන්තිකර්ම පද්ධතියේ අන්තර්ගත වෘක්ෂ ඇදහිලි විශ්වාස පරිසර පැවැත්මට උපයෝගී වන්නේ දැයි විමසීම අධ්‍යයන ගැටලුව විය. පහතරට ශාන්තිකර්මවල වෘක්ෂ කෙරෙහි දක්වන ලද පුද-පූජා, වත්-පිළිවෙත් ආදී ඇදහිලි හා විශ්වාස අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ යි. මෙය මානවවංශ පර්යේෂණයක් වන අතර ගුණාත්මක ක්‍රමය භාවිත විණි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය යටතේ දත්ත රැස් කිරීම සිදු විය. පහතරට සූනියම් කැපීම, දෙවොල් මඩු හා බලි ශාන්තිකර්ම නිරීක්ෂණය හා සහභාගීත්ව නිරීක්ෂණය ප්‍රාථමික මූලාශ්‍රය යටතේ ද, ඒ හා බැඳුණු සාහිත්‍යය අධ්‍යයනය ද්විතීයික මූලාශ්‍රය යටතේ ද සිදු කෙරුණි. වත්මන් පරිසර විනාශයට ඇතැම් සංවර්ධන ක්‍රියා මෙන් ම ජන සනත්වය, දේශපාලන, ආර්ථික, සමාජ ආදී තත්ත්ව බලපා ඇත. මිනිසාගේ සදාචාරය පරිසර පැවැත්ම කෙරෙහි බෙහෙවින් බලපායි. වෘක්ෂ හා මිනිසා අතර ඒකාත්මික සබඳතාව වටහාගත් අතීත ජනයා එය ආරක්ෂා කිරීමේ උපක්‍රමයක් ලෙස ඊට ආගමික වන්දනීයත්වයක් එක්කොට ඇත. පහතරට ශාන්තිකර්මවල රුක් පේ කිරීම, මල පේ කිරීම, මිල්ල කැපීම, රුක් පූජා, මල් පූජා, අත්ත මැතිරීම, නවකොළ අත්ත පූජා, කප් සිටුවීම වැනි වෘක්ෂ හා බැඳුණු වත්පිළිවෙත් මගින් සංස්කෘතික හා මනෝ විද්‍යාත්මක සාධක රැසක් ගම්‍යමාන කෙරේ. පරිසරයට සංවේදී මානසිකත්වයක් ගොඩනැගීමට ඉවහල් වන පරිසරය හා බැඳුණු ආගමික විශ්වාස මුල් කොටගත් ශාන්තිකර්ම උපත් කථා, පුරා කථා ආදී ජනශ්‍රැති ද මෙහි දී වැදගත් ය. එමගින් මිනිසා හා පරිසරය අතර සෞන්දර්යාත්මක, ආගමික සබැඳියාවත් ගොඩනැගී ඇත. ඇගයුම්ශීලී චින්තනයත්, දාර්ශනික ඥනයත්, සාම්ප්‍රදායික දැනුමත් යන විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් ඒ පිළිබඳ විමර්ශනයේ දී ඒවා හුදු මිථ්‍යා පිළිවෙත් නො වන බව පැහැදිලි ය. මෙම වත්-පිළිවෙත් මගින් පරිසරයට උත්තරීතර බවක් ප්‍රදානය කොට වෘක්ෂ කෙරෙහි මානවවාදී ආකල්ප හා ධර්මතා සංයුක්ත දර්ශනයක් ගොඩනගා ඇත. ඒ අනුව පහතරට ශාන්තිකර්මයන්හි අන්තර්ගත ඇදහිලි හා විශ්වාස මගින් පරිසරයෙහි පැවැත්මට හා ආරක්ෂාවට සහනදායී බලපෑමක් සිදු කර ඇති බව මෙම අධ්‍යයනයෙන් සනාථ විය.

**ප්‍රමුඛ පද:** *පරිසරය, වෘක්ෂ, අභිචාර, සංස්කෘතිය*